# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 11 ශ්‍රේණිය

The National e-learning Portal for The General Education

Start Your Learning Journey with e-thaksalawa

**ඒකකය - 6 වාක්‍ය රීති**

ඉගෙනුම් පල-:

- සම්මත රීති අනුගමනය කරමින් වාක්‍ය ලියයි.
- විවිධ රීතිවලට අයත් වාක්‍ය නිවැරදි ව ලිවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම 01.

1. පහත සඳහන් වගුවේ හිස් තැන් සම්පූර්ණ කරන්න.

| උක්ත කර්තෘ නාම පද | අනුක්ත කර්තෘ නාම පද |
|---|---|
| මම | |
| | අප විසින් |
| | තා විසින් |
| තොපි | |
| හේ/ඔහු | |
| | ළමයා විසින් |
| ළමයි | |
| දරුවෝ | |
| | ගුරුවරුන් විසින් |
| | මන්ත්‍රීන් විසින් |
| ගායිකාවක් | |
| | ගායකයකු විසින් |

2. හිස්තැන්වලට සුදුසු පදය යොදා වගුව සම්පූර්ණ කරන්න.

| උක්ත කර්ම පද | අනුක්ත කර්ම පද |
|---|---|
| මම | |
| | අප |
| තෝ | |
| | තොප |
| | ඇය |
| ඔහු | |
| ගොවියා | |
| | ගවයන් |
| කොක්කු | |
| | නයින් |
| | ශාස්තෘෘන |
| සේවිකාවක් | |
| සේවකයෝ | |
| | |

අන්තර්ගතය - එච්.එම්.ජේ.එස් කුමාරසිංහ , ආනන්ද විද්‍යාලය , කොලඹ 10

සැකසීම - ටී.එම්.ජී. දුලාන් සංජීව , නු/ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය , නුවරඑළිය

Copyright©www.e-thaksalawa.moe.gov.lk

3. හිස්තැන්වලට ගැළපෙන ක්‍රියා පද යොදා වගුව සම්පූර්ණ කරන්න.

| කර්තෘකාරක ක්‍රියා | කර්මකාරක ක්‍රියා |
|---|---|
| | ඇදෙයි/අදිනු ලබයි/ අදිනු ලැබෙයි |
| අදිති | |
| අදිහි | |
| | ඇදෙහු/අදිනු ලැබෙහු/අදිනු ලබහු |
| අදිමි | |
| | ඇදෙමු/අදිනු ලැබෙමු/අදිනු ලබමු |
| | දිවිණි/ දුවන ලදි/ දුවනු ලැබිණි |
| දිවූහ/ දිව්වෝය | |
| | දිවිණිහි/දුවනු ලැබිණිහි/දුවන ලදහි |
| දිවූහු/දිව්වෙහු | |
| | දිවිණිමි /දුවනු ලැබිණිමි/ දුවන ලදිමි/දුවන ලද්දෙමි |
| දිවූමු/ දිව්වෙමු | |
| නටන්නේය/නටන්නීය | |
| | නැටෙන්නෝය/නටනු ලබන්නෝය/ලැබෙන්නෝය |
| නටන්නෙහි | |
| | නැටෙන්නෙහු/නටනු ලබන්නෙහු |
| | නැටෙන්නෙමි/නටනු ලැබෙන්නෙමි/නටනු ලබන්නෙමි |
| නටන්නෙමු | |

04.පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් සත්‍ය ප්‍රකාශය ඉදිරියේ ඇති කොටුව තුළ  කුණත් අසත්‍ය ප්‍රකාශය ඉදිරියේ ඇති කොටු තුළ X ලකුණත් යොදන්න.

I. වාක්‍යයක සැම විට ම කර්තෘ උක්ත වෙයි. ☐
II. කර්තෘ අනුක්ත වීම යනු කර්තෘ පදය කර්තෘ විභක්තියෙන් තැබීමයි. ☐
III. වාක්‍යයක ක්‍රියාව කර්තෘ සමඟ පුරුෂ වචන හා කාරක වශයෙන් ගැළපිය යුතු ය. ☐
IV. කර්මකාරකයට හැරවිය හැක්කේ සකර්මක ක්‍රියා පමණි. ☐
V. අනුක්ත කර්මය ප්‍රථමාවෙන් සිටියි. ☐
VI. කර්මකාරක ක්‍රියාව අනිවාර්යයෙන් ම ලද/ලබ ධාතුන්ගෙන් සෑදිය යුතු ය. ☐
VII. උක්ත පදය ප්‍රථමා විභක්තිය ගනියි. ☐
VIII. අනුක්ත බහුවචන නාම පද 'න්' යන්නෙන් අවසන් වේ. ☐
IX. අනියමාර්ථ ස්ත්‍රීලිංග අනුක්ත පද 'අකු'ප්‍රත්‍යයෙන් අවසන් වේ. ☐
X. අනියමාර්ථ පුරුෂ ලිංග උක්ත රූපවල අග පවතින්නේ 'එක්' ප්‍රත්‍යය යි. ☐

අන්තර්ගතය - එච්.එම්.ජේ.එස් කුමාරසිංහ , ආනන්ද විද්‍යාලය , කොළඹ 10
සැකසීම - ටී.එම්.ජී. දුලාන් සංජීව , නු/ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය , නුවරඑළිය

Copyright©www.e-thaksalawa.moe.gov.lk

ක්‍රියාකාරකම 02.

1. පහත සඳහන් කර්තෘකාරක වාක්‍ය කර්මකාරයට හරවා ලියන්න.

i. උවැසිය මල් පුදයි.
ii. ඔහු මා විවේචනය කළේ ය.
iii. මහවැසි තොප කරදරයේ හෙළයි.
iv. වැද්දා මුවැත්තියක දුටුවේ ය.
v. ඔවුහු අප දිරිමත් කළෝ ය.

2. පහත සඳහන් කර්මකාරක වාක්‍ය කර්තෘකාරකයට හරවා ලියන්න.

i. බලවතුන් විසින් දුබලයෝ පෙළනු ලබති.
ii. මවුපියන් විසින් මම සුරැකුණෙමි.
iii. තොප විසින් පරිසරය වැනසිණි.
iv. දැරියක විසින් පොතක් ලියනු ලබන්නේ ය.
v. කම්කරුවන් විසින් මාවත් තැනෙයි.

ක්‍රියාකාරකම 03.

1. පහත සඳහන් වාක්‍ය සදොස් නම් නිදොස් කොට ලියන්න.

i. ගුරුවරු බොහෝ වැඩ කොට අඩු වැටුප් ලබති'යි සමහරු කියති.
ii. එම ආයතනයේ සේවිකාවන් ද ඇත.
iii. දෙමාපියෝ හා දරුවන් පාසලේ ඩෙංගු ශ්‍රමදානයට පැමිණියෝ ය.
iv. පියා මා කැටුව නගරයට ගියේ ය.
v. පියා හෝ මව රැස්වීමට යන්නෝ ය.
vi. ගජමන් නෝනා නොහොත් දෝන ඉසබෙලා මාතර යුගයේ ප්‍රකට කිවිඳියක් වූවා ය.
vii. දෙවිවරු වැනි මිනිස්සු ලොව සුන්දර කරති.

2. හිස් තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

i. ගොවියෝ හා --------------කුඹුර සාති (ගවයන්/ගවයෝ)
ii. වතු හිමියෝ ---------සමඟ ගැටෙති (කම්කරුවන්/කම්කරුවෝ)
iii. ඔහු මට ----------මෙන් සැලකුවේ ය. (පියකු/පියෙක්)
iv. කොරෝනා උවදුරෙන් -------- බරපතළ අර්බුදයකට මුහුණ දෙති'යි වෛද්‍යවරු පවසති.(ලෝ වැස්සන්/ලෝ වැස්සෝ)
v. සිංහයෝ -------- කොටියා මෘග සංහාරයේ යෙදෙයි. (නොහොත්/හෙවත්)

3. සුදුසු පදය වරහන් තුළින් තෝරන්න.

i. වෙළෙන්දෝ (පාරිභෝකයෝ /පාරිභෝගිකයන්) සූරා කති.
ii. මව (දරුවන්/දරුවෝ) කැටුව කුඹුරට යයි.
iii. රෝගියා ඉක්මනින් සුවය (ලබයි/ලබති'යි) හෙදිය සිතුවා ය.
iv. ඇ දක්ෂ (ශිෂ්‍යාවක/ශිෂ්‍යාවක්) වූවා ය.
v. බුත්සරණ රචනා කළේ, (විද්‍යාචක්‍රවර්තීන්/චක්‍රවර්තීහු) ය.

අන්තර්ගතය - එච්.එම්.ජේ.එස් කුමාරසිංහ , ආනන්ද විද්‍යාලය , කොළඹ 10
සැකසීම - ටී.එම්.ජී. දුලාන් සංජීව , නු/ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය , නුවරඑළිය

Copyright©www.e-thaksalawa.moe.gov.lk